බක්මීවැව එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමනාකරණ සැලැස්ම

කෘෂිකර්ම අමාත්‍යාංශය

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක කාර්යාලය - වයඹ පළාත

1 හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්,මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති, වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයකි. එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ මෙම මාහැගි අමිල නිර්මාණයක් වන එල්ලංගාව සංරක්ෂණය කර මනා කලමණාකරනයක් තුලින් ''දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ '' සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කලමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කලමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කලමණාකරනය කිරීම එල්ලංගා කලමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් (Profile) පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා කලමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන සැලැස්ම සකස් කර ඇත.එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමයි.

1.1 බක්මීවැව එල්ලංගාව හා එහි පිහිටීම.

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ 9 අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඹන්පොල ගොවිජන සේවා බල ප්‍රදේශයේ බක්මීවැව ග්‍රාම නිලධාරී කොට්ඨාශ තුල මෙම එල්ලංගා පද්ධතිය පිහිටා ඇත. මෙම එල්ලංගා පද්ධතියට වැව් 08ක් ඇතුලත් වේ. හඳුනාගත් වැව් 04ක් දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කිරීම සඳහා තෝරාගෙන ඇත. එල්ලංගාවේ භූමි ප්‍රෙද්ශය හෙක්436.8 වේ. බල ප්‍රදේශයේ වැඩි ඉඩම් ප්‍රමාණයක් පුරාණ රජ මහා විහාරයට අයත් පන්සල් ඉඩම් වන අතර පාරම්පරික කුඹුරු වගා කරනු ලබන ගොවීන් ද ඒ අතරවේ. හුදකලා කඳු කිහිපයක් හැරුණු විට සම්පූර්ණ එල්ලංගා පද්ධතිය මීටර් 274 කට වඩා අඩු උසකින් යුත් සාමාන්‍ය තැනිතලා භූමියකි.

ඉහළ හා මැදගනේ ගම වැව් ආශ්‍රිතව ගල් සහිත උස්බිමක් පිහිටා ඇති අතර මුළු එල්ලංගා පද්ධතිය තුලම වනාන්තර හෙක් 76. 4ක් ද කුඹුරු හෙක් 28.4ක් ද වන අතර මුඩුබිම් හෙක් 16.8ක් ද වැව් වල ජල පෝෂක ප්‍රදේශය 22.84ක් ද හඳුනාගත හැක.

සිතියම්අංක 01- මීඔය ද්‍රෝණියේ බක්මීවැව එල්ලංගාවේ පිහිටීම



සිතියම් අංක 01- බක්මීවැව එල්ලංගාවේ ග්‍රාමනිලධාරී කොට්ඨාශ

1.2 බක්මීවැව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා.

බක්මීවැව එල්ලංගාව පිහිටා ඇත්තේ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මීඔය ද්‍රෝණියේය .



අඹන්පොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල කුඩා පරිමාණයේ වැව් රාශියක් පිහිටා ඇත. එකිනෙක මත යැපෙන මෙම වැව් එල්ලංගා පද්ධතීන් සමූහයක් නියෝජනය කරයි. සුලු පරිමාණ වැව් 133ක් සම්බන්ධයෙන් එල්ලන්ගා පද්ධති 22ක් අඹන්පොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල පිහිටා ඇති අතර ඉන් විශාලතම එල්ලංග පද්ධතිය වැව් 27කින් සමන්විත පිදුරුවල්ල එල්ලංගාව වන අතර මැඩිල්ල අමුණ එල්ලංගාව වැව් 10කින් යුක්ත වේ. මෙම එල්ලංගාව ආසන්නයෙන්ම පිහිටා ඇත්තේ අස්සැදුම එල්ලංගාවයි. මෙම එල්ලංගාව වැව් 02 ක් ලේඛණ ගත වුවත් එහි වැව් 03 පිහිටා ඇත. සෙසු එල්ලංගා වල වැව් 1 සිට 12 දක්වා පරාසයක විහිදී පවතී . ව්‍යාපෘතිය මගින් තෝරාගත් එල්ලංගා 15ක වැව් 69ක් පුණරුත්ථාපනය කර ඇත. එහෙත් මෙම එල්ලංගා නිරීක්ෂණය කරන විට තවත් ලොකු හා කුඩා වැව් රැසක් පිහිටා ඇත. එල්ලංගාව සැලකිල්ලට ගැනීම්දී මෙම සියලු වැව් වල ජල ධාරිතාවය සලකා බැලිය යුතුය. තවද දෙවන අදියර යටතේ බක්මී වැව එල්ලංගාව තෝරාගත් වැව් 5ක් පුණරුත්ථාපනය කිරීමට නියමිතය. එල්ලංගා 15ක වැව් පුණරුත්ථාපනය කලද එල්ලංගා පද්ධති සංවර්ධන වැඩ සටහන යටතේ තෝරාගෙන ඇත්තේ වැව් 03ක් හා ඊට වැඩි සංඛාවක් වැව් පවතින්නාවූ එල්ලංගා පමනි . ඒ අනුව

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාෂය තුල එල්ලංගා පද්ධති සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක වන්නේ පද්ධති 09ක වන අතර මෙම එල්ලංගා බොහොමයක් එකිනෙකට ආසන්නයේ පිහිටා ඇත . මෙම සිතියම මගින් එල්ලංගා පිළිබඳව දළ අදහසක් ලබාදීමට උත්සාහගෙන ඇත.

- අඹන්පොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටා ඇති එල්ලංගා

වැව්ගණන, ආවරණය වන ප්‍රදේශය (හෙක්ටයාර්), කෘෂිහූමි ප්‍රදේශය (හෙක්ටයාර්) පහතින් දක්වා ඇත.

අනු අංකය	එල්ලංගාවේ නම	වැව් ගණන	ආවරණය වන ප්‍රදේශය (හෙක්ටයාර්)	කෘෂි හූමි ප්‍රදේශය (හෙක්ටයාර්)
1	කට්ටපුව	12	111	2 162
2	දටවමහ වැව	5	68	99
3	තම්මනාව	8	50	72
4	පිදුරුවල්ලාව වැව	27	190	275
5	අබගමමනවැව	7	40	58
6	හල්මිල්ලකොටුව	2	4	6
7	පොඩිකට්ටුව	4	51	74
8	පෙල්ව වැව	3	40	58
9	කුඩාවැව	2	5	8
10	මඩිල්ලඅමුණ	9	138	200
11	මමුණුගම	3	17	25
12	ගවරගමමන වැව	3	26	38
13	මහදිවුල් වැව	7	43	62
14	අත්තන් වැව	3	31	45
15	බක්මී වැව	5	51	74
16	පලාපත් වැව	11	41	59
17	ඇල්ලබඩගමන වැව	5	29	42
18	එරමඩු වැව	3	40	58
19	බොර වැව	5	29	42
20	කළුපෙරුම වැව	3	17	24
21	කෝරකහ වැව	2	13	19
22	කිරිමටියාව	4	29	42
මුළුඑකතුව		133	1063	1542

1.3 එල්ළංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඹන්පොල ගොවිජන සේවා බල ප්‍රදේශයේ බක්මීවැව ග්‍රාමනිලධාරී කොට්ඨාශ තුල මෙම එල්ලංගා පද්ධතිය පිහිටා ඇත. මෙම එල්ලංගා පද්ධතියට වැව් 08ක් ඇතුලත් වේ. හඳුනාගත් වැව් 04ක් දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කිරීම සඳහා තෝරාගෙන ඇත. එල්ලංගාවේ භූමි ප්‍රාදේශයේ හෙක්ටයාර 436.8 වේ. බල ප්‍රදේශයේ වැඩි ඉඩම් ප්‍රමාණයක් පුරාණ රජ මහාවිහාරයට අයත් පන්සල් ඉඩම් වන අතර පාරම්පරික කුඹුරු වගා කරනු ලබන ගොවීන්ද ඒ අතරවේ. හුදකලා කඳු කිහිපයක් හැරුණු විට සම්පූර්ණ එල්ලංගා පද්ධතියම

මීටර් 274 කට වඩා අඩු උසකින් යුත් සාමාන්‍ය තැනිතලා භූමියකි. ඉහළ හා මැදගනේ ගමවැව් ආශ්‍රිතව ගල් සහිත උස්බිමක් පිහිටා ඇති අතර මුළු එල්ලංගා පද්ධතිය තුලම වනාන්තර අක්කර 191ක්ද කුඹුරු අක්කර 71ක්ද වන අතර මුඩුබිම් අක්කර 4෧2ක්ද වැව්වල ජලපෝෂක ප්‍රදේශය ලෙස අක්කර 59.6ක්ද හඳුනාගත හැක.

වගු අංක 2 : බක්මීවැව එල්ලංගාව පිලිබඳ පරිපාලන තොරතුරු

මූලික තොරතුරු	**විස්තර**	**විශේෂිත කරුණු**
දිස්ත්‍රික්කය	කුරුණෑගල	
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	අඹන්පොල	
මැතිවරණ බල ප්‍රදේශය	යාපහුව	
ගංගා ද්‍රෝණිය	මීඔය (අංක 23)	ගංගා ද්‍රෝනිය වර්ග කි.මී.1530 පුරා ව්‍යාප්ත වී ඇති අතර දිග කි.මී.118 වේ.
එල්ලංගාව	බක්මීවැව	
වැව් සංඛ්‍යාව	04	මේ අතරින් හඳුනාගත් වැව් 04ක් දේශගුණ සුහුරු` ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කරයි.
වනාන්තරයේ පිහිටි වැව් සංඛ්‍යාව	0	
කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගන්නා වැව් සංඛ්‍යාව	04	වැවේ ජලය ප්‍රමාණවත් වන්නේ නම් යල කන්නය වගා කරනු ලැබේ. මහ කන්නයේ සියළු කුඹුරු වගාකරයි.
ග්‍රාම නිලධාරී කොට්ඨාශ	බොරවැව(174) හාබක්මීවැව(175)	බක්මීවැව ග්‍රාම නිලධාරී කොට්ඨාශය සඳහා බක්මීවැව වැවේ පෝෂක ප්‍රදේශය පමණක් ඇතුලත්වේ. බොරවැව ග්‍රාමනිලධාරී කොට්ඨාශය තුල පහල වල්පාලු වගා අඹගම්මන වැව පිහිටා ඇත.
එල්ලංගාවට අයත් ග්‍රාමනිලධාරි කොට්ඨාශ වලට අයත් මුළු භූමි ප්‍රමාණය	හෙක්ටයාර 914	
එල්ලංගාවට අයත් භූමි ප්‍රමාණය	අක්කර 467.1	

එල්ලංගාවෙන් පෝෂිත කෘෂිබිම්	මඩ ඉඩම් හෙක්. 42 / ගොඩ ඉඩම් හෙක්. 45	මහකන්නය - හෙක්.29 /
වැව්වල භූමි ප්‍රමාණය	හෙක්. 29	
එල්ලංගාවට අයත් වැව්වල මුළු ජල ධාරිතාවය	අක්කරඅඩි 68.3	
පෝෂක ප්‍රදේශයේ පදිංචි පවුල් සංඛ්‍යාව	103	
එල්ලංගාව තුලින් ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව	103	
එල්ලංගාවට අයත් ගොවිසංවිධාන	02	අඹගම්මනගොවිසංවිධානයහා පහලවල්පාළුවගොවිසංවිධානය

මූලාශ්‍රය - එල්ලංගා පැතිකඩ - අඹන්පොල / අඹනපොල PRA

වගු අංක 03- එල්ලංගාවේ භූමි පරිභෝජනය

වැවේ නම	මුළු භූමි ප්‍රමාණය (හෙ)	වනාන්තර (හෙ)	කුඹුරු (හෙ)	ජලපෝෂක ප්‍රදේශය(හෙ)	ජනාවාස	මුඩුබිම්(හෙ)
බක්මී වැව	87.52	47.56	8.8	14.92	27	16.1
අඹගම්මනවැව	4.92	2.76	5	0.2	0	1.96
පහලවල්පාළුව	11.08	10.28	7	0.2	0	0.6
තිබ්රිවැව	7.48	6.12	8.5	0.4	3	0.88
එකතුව	111	66.72	29.3	15.72	30	19.54

1.4.1.බක්මීවැව එල්ලංගා පද්ධතියේ සිතියම

බක්මීවැව එල්ලංගාවේ වැව් පිලිබඳ තොරතුරු

මෙම එල්ලංගාවේ වැව් 08ක් දක්නට ලැබුනද නාමිකව හඳුනාගත් වැව් හතරක් පමණක් දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කරඇත. එම වැව් පහ පිළිබඳ තොරතුරු පහත වගු අංක 03 මගින් පෙන්වාදී ඇත.

වගු අංක 04 - එල්ලංගාවේ වැව් පිලිබඳ විස්තර

වැවෙහි නම	ග්‍රාම නිළධාරි වසම	භාවිතයට ගනු ලබන සහ අත්හරින ලද වැවක්ද යන්න	ධාරිතාවය (අක්කරඅඩි)	ප්‍රතිලාභී ගොවි පවුල් සංඛ්‍යාව	වැවෙන් පෝෂණය වන වගා භූමි ප්‍රමාණය (අක්කර)	භූගෝලීය ඛණ්ඩාංක	
බක්මීවැව	බක්මීවැව	භාවිතයට ගනු ලැබේ	40	38	22	7.886702	80.176574
අඹගම්මන වැව	බොරවැව	භාවිතයට ගනු ලැබේ	16	40	30	7.891898	80.190895
පහලවල්පා එව	බොරවැව	භාවිතයට ගනු ලැබේ	6	15	07	7.881893	80.188088
තිබිරිවැව	බක්මීවැව	භාවිතයට ගනු ලැබේ	3	10	12	7.889924	80.170038

මූලාශ්‍රය - ගොවි සං. පෝෂක / අඹන්පොල ගොවිජන සේවා මධ්‍යස්ථානය

1.4 බක්මීවැව එල්ලංගාව තිරසාර ලෙස කලමණාකරනය කිරීමේ වැදගත්කම

බක්මීවැව එල්ලංගාවේ වැව් 04න් දල වශයෙන් අක්කර 75 පමණ භූමි ප්‍රමානයක වී වගාකරනු ලබයි. එමගින් ප්‍රතිලාභ ලබන ගොවී පවුල් සංඛ්‍යාව 103ක් පමණවේ. දැනට මෙම ප්‍රයෝජනයට ගන්නා වැව් පහේ ජලධාරිතාවය අක්කර අඩි 75 පමණ වන අතර යල සහ මහකන්න වල මෙම ප්‍රදේශයේ වී නිෂ්පාදනය සඳහා දායකවේ. එල්ළංගාව තුල සමස්ථ ජනගහනය 1369ක් පමන වාසයකරයි . මෙම සියලුදෙනා එල්ළංගාව තුල විවිධ කටයුතුවල නිරතවේ. මේ අනුව එල්ළංගාව දැනටමත් විශාල භායනයකට පත්වඇත. කාලයක් තුල සිදුවී ඇති වන විනාශය අවිධමත් හේන් හා ගොඩ ඉඩම් වගාව නිසා සිදුවන පාංශුඛාදනය වැව් ඉස්මත්ත අනවසරයෙන් අල්ලාගෙන කුඹුරු වගාකිරීම වැනි ක්‍රියාකාරකම් නිසාම වැව් හා ඇල පද්ධතිය ගොඩවීම එල්ළංගාව බලවත් තර්ජනයකට මුහුණ දීමට හේතු වී ඇත. තවද ජනගහනය වර්ධනය හා ඉඩම් බෙදී යාමත් පවතින සම්පත් දිනෙන් දින වේගයෙන් භාවිතයට ගැනීමත් හිගවීමත් නිසා මෙම ප්‍රදේශවල වැව්ජලය සීග්‍රයෙන් සිදීයාමේ තර්ජනයකට මුහුණදෙමින් සිටී. වසර ගණනක දේශගුණ දත්තයන් සලකා බලන විට ජලමාර්ග සිදීයමින් දේශගුණික විපර්යාශයන් අනුව මෙම තත්වය තවදුරටත් වෙමින් පවතී. . මෙම තත්වයෙන් මෙම එල්ළංගා පද්ධතිය බේරාගැනීමට නම් වැව් පුණරුත්ථාපනය පමනක් කොහෙත්ම ප්‍රමානවත් නොවේ. .මෙම තත්වයට එකම විසඳුම වන්නේ සමස්ථ එල්ලංගාව මතිරසර ලෙස සංවර්ධනයට භාජනය කිරීමයි. ඒ අනුව එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස්කර අමුනුකොලේගම එල්ළංගාව

ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ අවධානය මෙම එල්ලංගාව වෙත යොමුවී ඇත. එහිදී එල්ලංගා කලමනාකරණ කමිටුව මගින් එල්ලංගා පැතිකඩක් හා එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස්කර ඒ මගින් එල්ලංගාව සංවර්ධනය කිරීමට සැලසුම්කර ඇත. ඒ අනුව එල්ලංගාවේ පහත අත්‍යාවශ්‍ය අංගෝපංග ප්‍රසස්ථමට්ටමින් පවත්වාගෙන යාමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කලයුතුවේ. එහිදී අනුගමනය කල යුතු ප්‍රධාන දස වැදැරුම් ක්‍රියාමාර්ග මෙසේය.

I. වැවේ පෝෂිත ප්‍රදේශය සංවර්ධනය. මේ යටතේ ප්‍රමානවත් වෘක්ෂලතා ආවරණයක් පිහිටුවීම හා පවතින වෘක්ෂලතා කලාපය ආරක්ෂා කිරීම.
II. වැව් ඉස්මත්තේ සිදු කෙරෙන අණවසර වගාවන් නිසා සිදුවන ප්‍රබල පාංශුබාදනය අවම කිරීමට පියවර ගැනීම.
III. මෙහිදී වැව තුල අණවසරයෙන් කුඹුරු වගාකරන ගොවීන් ඉවත් කිරීම.
IV. වැව ඉස්මත්තේ හේන් වගාබිම් සඳහා පාංශු සංරක්ෂණ වැටි දැමීම.
V. වැව වටා ශක්තිමත් පෙරණයක් (Filter) යෙදීම .
VI. පවතින ගොඩවල පුණරුත්ථාපනය හෝ අවශ්‍ය ස්ථාන වල ආරක්ෂිත වැටි මගින් වැවට ගලා එන ජලය මගින් ගෙන එන දැ අවම කිරීම.(වැව ගොඩ වීමට බලපාන රොන්මඩ, වැලි සහ මැටි, ශාක හා සත්ව කොටස්)
VII. වැවේ කට්ටකඩුව, ගස්ගොම්මන, ඉස්වැටිය යන අංගයන් නැවත හැකි පමනින් නැවත පිහිටුවීම .
VIII. වැවේ හා වාරි මාර්‍ගපද්ධතියේ නඩත්තුව විදිමත් පරිදි පවත්වා ගෙනයාම.
IX. වැවේ රාජකාරී සම්බන්ධයෙන් පැරණි සිරිත් විරිත් නීතිරීති අනුගමනය කිරීමට හා ක්‍රියාත්මක කිරීමට ගොවිසංවිධාන යොමුකිරීම .
X. ඉහත කරුණු පිළිබඳව ගොවි සංවිධාන ගොවීන්ට පුළුල් දැනුමක් ලබාදීම .

මීට අමතරව එල්ලංගා කළමනාකරණ කමිටුව (CMC) මගින් නිරන්තරයෙන් එල්ලංගාව අධීක්ෂණය කරමින් තත්වය කළමනාකරණය කිරීම හා අදාල වගකිවයුතු ආයතනවල ප්‍රමාණවත් මැදිහත්වීම. දේශගුණ සුහුරු වයාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව මෙම වැව් වල ධාරිතාවය අක්කර අඩි 267.86 දක්වා ඉහළ නැංවෙන අතර ඒ අනුව වී නිෂ්පාදනය බුසල් 110 දක්වා ඉහළ නැංවීමට බලාපොරොත්තුවේ. කෙසේවූව ද එල්ලංගාවේ පිහිටි වැව් 08න් 04ක් එල්ලංගා සංවර්ධන ප්‍රවේශය (Cascade Development Approach) උපයෝගී කරගනිමින් ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කරනු ලබන අතර එහිදී මුළු පද්ධතියේ තිරසර පැවැත්ම තහවුරුවන ආකාරයට එල්ලංගාව සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කරයි. ඒ අනුව එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස්කර බක්මීවැව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරිකෘෂිකර්ම ව්‍යාපෘතිය අවධානය යොමුකර ඇත.එහිදී එල්ලංගා කලමණාකරන කමිටුවට එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස්කිරීමට ව්‍යාපෘතිය සහාය ලබාදේ.

1.6. එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වාරි කලමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කලමණාකරන ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එනම්,"**එල්ලන්**"සහ"**ගාව**"යන වචන දෙක එකතු වී සකස්වී ඇත."**එල්ලන්**" යනු එල්ලෙන යන්නයි. "**ගාව**"යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි. ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණය එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස ද නම්කර ඇත. එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා එල්ලංගාවට කලමණාකරන සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩකර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. එසේම එල්ලංගා කලමණාකරන කමිටු නීතිගත

කිරීමට ද අවශ්‍ය කටයුතු සිදුකරනු ලබයි. පරිපාලන දිස්ත්‍රික්ක 11ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍රලේඛය අනුව (ඇමුණුම01) එල්ලංගා කලමණාකරන කමිටු 54ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තුවේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාලපාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතුකර එල්ලංගා කලමණාකරන කමිටු 54 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.

එල්ලංගා කලමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විතවේ. ඒවානම් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුව, පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ගොවි සංවිධාන, ප්‍රජා මූලසංවිධාන, ජලසම්පත් මණ්ඩලය, ආපදා කලමණාකරන කාර්යාංශය, පොලිස් දෙපාර්තමේන්තුව, ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, පෞද්ගලික අංශය, ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව යන ආයතනවේ. එල්ලංගා කලමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙනයාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය ,ප්‍රජාමූල සංපෝෂක ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇති අතර ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහන් අංක02 මගින් දක්වා ඇත.

රූප සටහන් අංක 01: එල්ලංගා පද්ධති කලමණාකරනය සඳහා වර්තමානයේ සම්බන්ධිත ප්‍රධාන ආයතන

1.7 එල්ලංගා කලමණාකරන කමිටුවක අවශ්‍යතාවය

මෙරට ඒකාබද්ධ කළමණාකරණ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන් මහවැලි ව්‍යාපාරය හා ඉන් මාස් වැඩසටහන ප්‍රමුඛතාවයගනී . මෙම වැඩසටහන් ජලය හා බැඳුනු මහා වාරිමාර්ග පදනම් කරගත් ව්‍යාපාරවේ. මෙම වැඩසටහන් අතුරෙන් 1984 ආරම්බ වූ ඉන් මාස් (ඒකාබද්ධ වාරිමාර්ග කළමනාකරණ වැඩසටහන) වැඩසටහන (මහා වාරිමාර්ග පුණරුත්ථාපන වැඩසටහන MIRP හා වාරිමාර්ග පද්ධති කළමනාකරණ වැඩසටහන් ISMP ව්‍යාපෘති) වැදගත් තැනක් ගනුලබන්නේ එයද ලෝක බැංකුවේ අනුග්‍රහයෙන් මෙරට ක්‍රියාත්මක වී අද දක්වා ම සාර්ථකව ක්‍රියාත්මක වන බැවිනි. මෙරට මහ ගොවිජනපද ව්‍යාපාරවල ගොවි සංවිධාන පිහිටුවීමේ ආරම්භක පියවරක් ගනු ලැබුවේ මෙම ඉන් මාස් වැඩසටහන (ඒකාබද්ධ වාරිමාර්ග කළමනාකරණ වැඩසටහන) තුලින්ය. මෙම ගොවිජනපද ව්‍යාපාර කළමනාකරණය කිරිම ව්‍යාපාර කළමනාකරණ කමිටුව මගින් සිදුවේ. මෙම එල්ලංගාව කළමනාකරණය කිරීමද එල්ලංගා කළමනාකරණ කමිටුව මගින් ඉටුකිරීමට ලෝක බැංකුව අපේක්ෂා කරයි. ඉහතින් කියවෙන ව්‍යාපාර කළමනාකරණ කමිටුව හා මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බොහෝ දුරට සමානකම් දක්වයි. මෙහි කළමනාකාරිත්වය රජයේ නිලධාරින්ගේ හා එල්ලංගාවේ ප්‍රතිලාභීන් හවුල්කරගෙන හවුල් කළමනාකරණයක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. ඉහත අංක දරණ ජේදයට අනුව මෙම එල්ලංගා කළමනාකරණ කමිටුවේ අන්තර්ගතය සටහන් කර ඇත. ඉතා වේගවත්ව හායනයට යමින් පවතින ලෝක උරුමයක් ලෙස හඳුනාගෙන ඇති එල්ලංගාව නැවතත් තිරසරව පවත්වාගෙන යාමට මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බෙහෙවින් ඉවහල් වනු ඇත .

1.8. එල්ලංගා පැතිකඩ සකස්කිරීමේ අවශ්‍යතාව.

එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා අතීතයේ පැවති සාම්ප්‍රදායික ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජආර්ථීක වත්පිලිවෙත්, සම්ප්‍රදායන් හා චාරිත්‍රවාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරුවූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස්වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත්විය.වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක්වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වාගැනීමේදී හා මනා කලමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනාගැනීම ඉතාමත් වැදගත්වේ. මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජලවිද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනාගත යුතුවේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිලිබඳව, විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා,ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතුකර එල්ලංගා පැතිකඩක් සකස්කරනු ලබයි.මෙම එල්ලංගා පැතිකඩ එල්ලංගා පද්ධති කලමණාකරනයේ දී මූලික අවශ්‍යතාවයකි.

1.9 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස්කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ තිරසරව පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කලමනාකරණ වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කලමණාකරනය කල යුතුවේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කරගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කලමණාකරන සැලැස්මක් සකස් කරනු ලැබේ. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක,ජල විද්‍යාත්මක,පරිසර විද්‍යාත්මක,බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස්කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ(Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපාය මාර්ගික මැදිහත්වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාල වකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්වියයුතු පාර්ශවකාර ආයතනයන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කලමණාකරන මූලික සැලැස්මක් (Cascade

Management Plan) සැකසීම. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදුවී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

1.10 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ, ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩුවීම,අවිධිමත් හේන් වගාව,වනාන්තර එළිපෙහෙලි කිරීම, සත්ව පාලන කටයුතු, කැලිකසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හානියට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිලිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා බෙහෙවින් ඉවහල්වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට,ප්‍රාදේශීය දේශපාලකයින්ට,පාර්ශවකාර ආයතන වලට සහ ගොවි ප්‍රජාවට එල්ලංගාව පිලිබඳව නිවැරදි අවබෝධයක් ලබාගැනීමට සහ එල්ලංගාව ආරක්ෂා කරගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත්වේ.එල්ලංගා පද්ධතිය ආරක්ෂා කරගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන මූලික සැලැස්මක් සැකසීම(Cascade Management Plan)සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත්වේ.මෙහි සඳහන් මූලික එල්ලංගා කලමණාකරන සැලැස්ම එල්ලංගා කලමණාකරන කමිටුව විසින් සකස්කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස්කරනු ලබයි.

2.බක්මීවැව එල්ලංගා පැතිකඩ සකස්කිරීමේ දී භාවිතා කල ක්‍රමවේදය

බක්මීවැව එල්ළංගාව පැතිකඩක් සකස් කිරීමේදී පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබීය.

එල්ළංගා කළමණාකරණ කමිටුවේ විශේෂ රැස්වීමකදී එල්ළංගා පැතිකඩක අවශ්‍යතාවය හා ඒ තුලින් එල්ළංගා සංවර්ධන සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සාකච්ඡාවට ගනු ලැබීය. එම පැහැදිලි කිරීම් අනුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ සියලු සාමාජිකයින් මෙම හරස්කඩ චාරිකාව සංවිධානය කිරීමට එකගතාවය පල කරන ලදී. ඉන් අනතුරුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ නියෝජිතයන් හා ගොවි සංවිධාන නියෝජිතයන් සමග එල්ලංගා හරස්කඩ චාරිකාව සැලසුම් කරන ලදී . මේ සඳහා යෝජිත දිනය ලෙස යොදාගනු ලැබුවේ 2024.12.23 දිනයයි. මෙම චාරිකාව කණ්ඩායම් 4කින් යුක්තවිය . එල්ලංගාවේ හරස්කඩ චාරිකාව සැලසුම් කරන ලද්දේ සරල රේඛාවක් හරහා ගමන් කිරීමෙන් නොව බහු අශ්‍රයක් තුල (Polygon) නිරීක්ෂණය කිරීමයි. වඩාත් ගුණාත්මක දත්ත සපයා ගැනීමේ අපේක්ෂාවෙන් හා එම දත්ත යොදාගෙන ගුණාත්මක වාර්ථාවක් ලබාගැනීම මෙහි අරමුණවිය. මේ සඳහා දත්ත සටහන් කරගැනීමට හැකියාව ඇති නිලධාරියකු ව්‍යාපෘතිය මගින් යොදාගත් අතර මගපෙන්වීම සඳහා ගොවිසංවිධාන නියෝජිතයන් හා ගෙවිජන සංවර්ධන නිලධාරීන් කෘෂිකර්ම නිශ්පාදන සහකාර හා ග්‍රාමනිළධාරීන් මේ සඳහා සහභාගී වු සෙසු නිලධාරීන් වූහ.

වගු අංක 05 - හරස්කඩ චාරිකා පිළිබඳ තොරතුරු

දිනය	2024-05-16		
කණ්ඩායම	ආවරණය කරන ලද ප්‍රදේශය	ආරම්භක ස්ථානය	සහභාගීවූ සාමාජිකයන් ගණන
01	බක්මීවැව	බක්මීවැව සමිති ශාලාව	7

02	අඹගම්මනවැව	බක්මීවැව සමිති ශාලාව	12
03	පහලවල්පාළුව	වල්පාළුව සමිති ශාලාව	10
04	තිබ්බිරිවැව	බක්මීවැව සමිති ශාලාව	13

මෙම හරස්කඩ චාරිකාවේදී ගමන් මාර්ගයේ භූගෝලීය තොරතුරු,භූ විද්‍යාත්මක තොරතුරු,ජල විද්‍යාත්මක තොරතුරු,පරිසර විද්‍යාත්මක තොරතුරු,සමාජ ආර්ථික තොරතුරු,සම්පත් භායනයේ බරපතලකම පිලිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මගින් තොරතුරු එකතු කරගන්නාලදී.හරස්කඩ චාරිකාව සඳහා ප්‍රතිලාභීන් ගොවි සං පෝෂක සාමාජිකයින් හා සියලු රාජ්‍ය ආයතනවල නිලධාරීන් සහභාගීවූ අතර චාරිකාවෙන් එක්රැස් කරගන්නාලද තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කරගැනීම සඳහා 2025.01.13දින නැවත ඊට අදාළ සියලු පාර්ශව වල සහභාගීත්වයෙන් බක්මීවැව රජමහා විහාරයේ දී වැඩමුළුවක් පවත්වනලදි. විශේෂයෙන් ම මෙම එල්ලංගා පැතිකඩේ ඇති තොරතුරු එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත් වන අතර එල්ලංගාව අධ්‍යයනය කරනු ලබන අයට එල්ලංගාව පිලිබඳව තොරතුරු ලබාගැනීමේදී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධන කටයුතු සැලසුම් කිරීමේදී බෙහෙවින් ඉවහල්වනු ඇත.

03.බක්මීවැව එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේදී අනුගමනය කරනලද ක්‍රමවේදය

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, බක්මීවැව එල්ලංගාවේ පවතින තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශවකාර ආයතන සම්බන්ධිත එල්ලංගා කලමණාකරන කමිටුව වැනි ආයතනයක අවශ්‍යතාවය තහවුරුවිය.මෙම අරමුණ ඉටුකරගැනීම සඳහා එල්ලංගා කලමණාකරනය සඳහා ප්‍රධාන කාර්යයක් ලෙස විද්‍යානුකූල හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කලමණාකරන සැලැස්මක් අවශ්‍ය බවටද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය.එල්ලංගා කලමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමට එය උදව්වක් විය.පිලිවෙලින් එල්ලංගාව අධ්‍යානය කිරීම හා ද්විතීය හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතුකිරීම,තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය.

එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි.ඒ සඳහා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කලයුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක,පරිසර විද්‍යාත්මක,ජල විද්‍යාත්මක,සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහුපාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි.දත්ත උත්පාදනය,ත්‍රිමානකරණය,දත්ත විශ්ලේෂනය,වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන්ගෙන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කරගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍යවේ.මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය.එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

I. රැස්වීම් පැවැත්වීම

II. ද්විතීය දත්ත එකතු කිරීම

III. හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතාකර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම

IV. එල්ලංගාව මුහුණදෙන අභියෝග හඳුනාගැනීම

V. එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම

VI. එල්ලංගා පැතිකඩ සැකසීම

VII. ගැටළු වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම හා විතාකර උග්‍රගැටළු හඳුනාගැනීම

VIII. යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමුකල යුතු උග්‍රගැටළු හඳුනාගැනීම

IX. එල්ලංගා සැලැස්ම සැකසීම

X. පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කරගැනීම

XI. එල්ලංගා කලමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍රගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ගික සැලසුම් සකස්කිරීම

XII. යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා කෙටිකාලීන(Short Term),මධ්‍යකාලීන(Medium Term) හා දීර්ග කාලීන(Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාල වකවානු තීරණය කිරීම හා දල ඇස්තමේන්තුවක් සකස්කිරීම ආදිය එල්ලංගා කලමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කලමනාකරන සැලැස්මට ඇතුලත් කරනලදී.

3.1. තොරතුරු කළමනාකරණ සැලැස්ම සැකසීම .

එල්ලංගා ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කලයුතු අතර එහි දී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහුපාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනුලබයි. දත්ත උත්පාදනය, දත්ත විශ්ලේෂනය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන්ගෙන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කරගැනීම සඳහා බහුවිධි දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍යවේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසිම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරනලදී.

(i) රැස්වීම් පැවැත්වීමට
(ii) ද්විතීය දත්ත එකතුකිරීම
(iii) හරස්කඩ චාරිකාව / බහුඅග්‍ර අධීක්ෂණය වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතාකර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම
(iv) එල්ලංගාව මුහුණදෙන අභියෝග හඳුනාගැනීම
(v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු පුරෝකථනය කිරීම
(vi) එල්ලංගා පැතිකඩ සැකසීම
(vii) ගැටළු ගස වැනිසහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතාකර උග්‍ර ගැටළු හඳුනාගැනීම, යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතාකර කඩිනමින් අවධානය යොමුකල යුතු උග්‍ර ගැටළු හඳුනාගැනීම

(viii) එල්ලංගා සැලැස්ම සැකසීම
(ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම
(x) එල්ලංගා කලමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් හඳුනාගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දළ ඇස්තමේන්තුවක් හා කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන වශයෙන් බෙදාවෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු එල්ලංගා කලමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරන සැලැස්ම සකස්කර ඇත.

3.2. බක්මීවැව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනාගැනීම

බක්මීවැව එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනාගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ එක් ප්‍රධාන කාර්යයකි.දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක එල්ලංගා පද්ධති **57** ආවරණය වන පරිදි එල්ලංගා කලමණාකරන කමිටු 54ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව,ව්‍යාපෘතියේ ඊළඟ කාර්යයවී ඇත්තේ සෑම එල්ලංගා කලමණාකරන කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස්කරදීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි.එල්ලංගාව සහ එල්ලංගාව මුහුණදෙන ගැටළු හඳුනාගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත්වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කලමණාකරන සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත්වේ.ඒ අනුව අභියෝග හඳුනාගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම,දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළයුතු ක්‍රමවේද තීරණයකිරිම,එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කලමණාකරන සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝකබැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී.එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛන පරිශීලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරනලදී.එහි දී එල්ලංගාව හරහා චාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ මෙහි 4වන කොටස යටතේ දක්වා ඇති ප්‍රධාන අභියෝග හඳුනාගන්නා ලදී. අභියෝග ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වර්ගීකරණය කරන ලදී.ඒවානම්

1. භූගෝල විද්‍යාත්මක
2. භූ විද්‍යාත්මක
3. ජල විද්‍යාත්මක
4. පාරිසරික විද්‍යාත්මක
5. මානවහැසිරීම්
6. සමාජ ආර්ථික
7. කෘෂිකාර්මික
8. වාරිමාර්ග කලමණාකරන
9. පෝෂිත ප්‍රදේශයේ තත්වය යන ආදියයි.

මේවා එල්ලංගා කලමණාකරන සැලැස්ම සකස්කිරීමේ දී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත.මෙම අභියෝග තවදුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනාගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරුකරගෙන ඒවා පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාරකරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත්කර ඇත.

04 .බක්මීවැව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ

4.1. භූගෝලීය(Geographical) තොරතුරු

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කුරුණෑගල දිස්ත්‍රික්කයේ උතුරු මායිමේ පිහිටා ඇති අතර උතුරින් ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද, දකුණින් මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද නැගෙනහිරින් ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ට ද මායිම් වන අතර බටහිර මායිම වන්නේ කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි. මෙහි භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 136.96 ක් වේ. භූ විෂමතාවය අනුව සලකා බලන විට සමස්ථ භූමියම තැනිතලා ස්වරූපයක් ගනී.උපරිම උන්නතාංශය අඩි 315 ක් වන අතර එය දකුණු මායිමට ආසන්නව පිහිටා ඇත.අවම උන්නතාංශය අඩි 212 ක් පමණ වන අතර එය උතුරු මායිමේ මී ඔය ආසන්නයේ පිහිටා ඇත.

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර හා මධ්‍ය ප්‍රෙද්ශ වල පිහිටි ග්‍රාම නිලධාරි කොට්ඨාශ දෙකක් වන බක්මීවැව හා වරාගම්මන ග්‍රාම නිලධාරි කොට්ඨාශ තුල පිහිටා ඇති බක්මීවැව එල්ලංගාව හෙක්ටයාර 436.83 භූමි ප්‍රදේශයක් තුල පැතිරී ඇත. භූ විෂමතාවය අනුව සලකා බලන විට සමස්ථ භූමියම තැනිතලා ස්වරූපයක් ගනී.

මෙම එල්ලංගාව තරමක් කුඩා එල්ලංගාවකි. එහි වැව් 08 ක් පිහිටා ඇති අතර එල්ලංගාව නැගෙනහිර සිට බටහිර දෙසට කි.මී. 1ක් පමණ දක්වා විහිදී යයි. විශේෂිත උස් කඳු වැටි ප්‍රදේශය තුල දක්නට නොමැකි අතර ප්‍රදේශයේ පවතින උන්නතාංශය අනව එල්ලංගාවට ලැබෙන වර්ෂාවෙන් ගලා යන ජලයෙන් වැව් පෝෂණය වේ . ස්වාභාවික වනාන්තර හෙක් 170 පමණ වේ . එල්ලංගාව තුල ගෙවතු වගාව හා නිවාස කෘෂිකාර්මික ඉඩම් පිහිටා ඇත ලැබෙන වර්ෂාපතනය. මෙම භූ විශමතාවය අනුව වේගවත්ව වැව් තලට ගලා යයි. ප්‍රදේශයේ පවතින්නේ රැලි සහිත භූමියකි. මෙම භූ විශමතාවය අනුව ලැබෙන වර්ෂාපතනය වැව් වලට එක්වනවා හැර විශේශිත ජල මාර්ග හෝ ඇලවල් නැත. බක්මීවැව එල්ලංගාව මෙන්ම ප්‍රාදේශයේ සෙසු එල්ලංගා වලින් පිටතට ගලායන ජලය ඉගිනිමිටිය ජලාශයට රැස්වේ. අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මුලුමනින්ම ඉගිනිමිටිය ජලාශයේ පෝෂිත ප්‍රදේශය ලෙස සැලකිය හැකිය .

4.2. භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

මෙම එල්ලංගව අයත් ප්‍රාදේශීය කොට්ඨාසයේ පස පිළිබද සලකා බැලීමේ දී පාංශු ඛාණ්ඩ තුනක් මෙම ප්‍රදේශයේ දැකිය හැකිය.දුර්වල ජලවහනයක් පවතින රතුදුඹුරු පස,රතුදුඹුරු පසෙහි ක්ෂාරිය නොවන දුඹුරු පස හා දියළු පස එම පස් වර්ගවේ.ඒ අනුව මෙම එල්ලංගාවේ බහුලවම දක්නට ලැබෙන්නේ රතුදුඹුරු පසෙහි ක්ෂාරිය නොවන දුඹුරුපසකි. එහෙත් කුඹුරු වල ලොම් පසක් පවතී. හෙක්ටයාර 436.83 පුරා ව්‍යාප්ත වී ඇති



මෙම එල්ලංගාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 50% පමණ වනාන්තර ප්‍රදේශයක් වන අතර කුඹුරු ලෙස 7% පමණ ද වෙනත් බෝග සඳහා සහ අනෙකුත් පරිබෝජනය සඳහා 15% පමණ ද යොදාගෙන ඇත. 9 % පමණ මුඩුබිම් ද හඳුනාගත හැක. අඹන්පොළ ප්‍රදේශයට දකුණු දෙසට පතිත වන වැසි ජලය බටහිර දෙසට ගලා බසින අතර එය දැදුරු ඔයට එකතු වේ. ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ දක්නට ලැබෙන සියලු ස්වාභාවික ජල මාර්ග බොහෝ ස්ථානවල අවහිර කර ඇති අතර වගාව සඳහා ජලය රඳවා ගැනීමට කුඩා වැව් හා අමුණු රාශියක් ඉදිකර ඇත.වැසි සමයේදී, ජලය වේගයෙන් ගලා යාම නිසා දැඩි පාංශුඛාදනයක් සිදු වේ. මෙම ප්‍රා ලේකම් කොට්ඨාශය තුළ ඇති මුළු කුඩා වැව් වලින් සැලකිය යුතු සංඛ්‍යාවක් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කරයි . වියළි කාලවලදී භූගත ජල මට්ටම අඩි 30 ක් පමණ ගැඹුරට දක්නට ලැබෙන අතර දැනට ඇතැම් ගම්මානවල කෘෂි ළිං සහ නළ ළිං හරහා මෙම ජලය ලබා ගනී. වර්ෂාවෙන් ලැබෙන ජලය කාලීණ ජල මාර්ග ඔස්සේ ගලා ගොස් සුලු කාලයකින් සිදීයයි. මෙම කුඩා ජලාශවල වාන් දමන කාලයද ඉතා කෙටි වන්නේ වැව් ඉස්මත්තේ නිසි පෝෂිත ප්‍රදේශයක් නොමැති නිසාය .

සිතියම්අංක 03 - බක්මීවැව එල්ලංගාව ආශ්‍රිතව පස

මූලාශ්‍රය - ජල විද්‍යාත්මක පර්යේෂණ ග්‍රන්ථය (දේශගුණ සුහුරු ව්‍යාපෘතිය)

ප්‍රස්තාරඅංක01 එල්ලංගාවේ භූමි පරිබෝජනය



මූලාශ්‍රය - ජල විද්‍යාත්මක පර්යේෂණ වාර්තාව (දේශගුණ සුහුරු ව්‍යාපෘතිය)

4.3ජල විද්‍යාත්මක(Hydrological) තොරතුරු හා වාරිමාර්ග කළමනාකරණය

මෙම එල්ලංගාව මී ඔය ගංගාද්‍රෝණිය තුල පිහිටා ඇති අතර මී ඔය ගංගාද්‍රොණිය උපද්‍රෝණි අටකට වෙන් කර ඇත. බක්මීවැව එල්ලංගාව එහි තුන්වන උප ද්‍රොණියේ පිහිටා ඇත.මෙම එල්ලංගාවට අයත් වැව් සඳහා වාර්ෂිකව හා මාසිකව ලැබෙන වර්ෂාපතනය ගණනය කිරීමේ දී මද්‍යාස්ථාන තුනකින් මෙම ගණනය කිරීම සිදුකරනු ලබයි. එල්ලංගාවට අයත් ප්‍රතිසංස්කරනය කරනු ලබන වැව් හතරෙන් තිබිරිවැව හා අඹගම්මන වැව් සඳහා වාර්ෂික හා මාසික වර්ෂාපතනය ගණනය කිරිම මැදියාව වැව මධ්‍යස්තානය මගින් දපහලවල්පාලුව වැවට අදාළ දත්ත අතර ගල්ල මධ්‍යස්ථානය මගින් ද බක්මීවැව (මහවැව) පිලිබඳ දත්ත ඉඟිණිමිටිය මධ්‍යස්ථානය මගින්ද සිදුකරනු ලබයි.

ඒ අනුව එක් එක් වැව සම්බන්ධ වාර්ෂික හා මාසික වර්ෂාපතන දත්ත පහත පරිදිවේ.

වගු අංක 06 - බක්මීවැව එල්ලංගාවට අයත් වැව් සඳහා වාර්ෂික හා මාසික වර්ෂාපතන සම්බන්ධ තොරතුරු

වැවේ නම	ගණනය කරන මධ්‍යස්ථානය	සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය	මාසික වර්ෂාපතනය ඉහළ කාලසීමා
තිබිරිවැව	මැදියාව මධ්‍යස්ථානය	මි.මි.1473	ඊසානදිග මෝසමේ මුල් කාලපරිච්ඡේදය හා අන්තර් මෝසම් කාලසීමා
අඹගම්මනවැව			
පහලවල්පාලුවවැව	අතරගල්ල මධ්‍යස්ථානය	මි.මි.1091	අන්තර් මෝසම් කාලසීමාව
බක්මීවැව	ඉඟිනිමිටිය මධ්‍යස්ථානය	මි.මි.1209	ඊසානදිග මෝසම් කාල පරිච්ඡේදය හා අන්තර් මෝසම් කාලසීමා

මූලාශ්‍රය - ජල විද්‍යාත්මක පර්යේෂණ වාර්තාව (දේශගුණ සුහුරු ව්‍යපෘතිය)ප්‍රස්තාර අංක 02 - මැදියාව මධ්‍යස්තානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම



මූලාශ්‍රය - ජල විද්‍යාත්මක පර්යේෂණ වාර්තාව (දේශගුණ සුහුරු ව්‍යපෘතිය)

ප්‍රස්තාර අංක 03 - අතරගල්ල මධ්‍යස්ථානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම



මූලාශ්‍රය - ජල විද්‍යාත්මක පර්යේෂණ වාර්තාව (දේශගුණ සුහුරු ව්‍යපෘතිය)

ප්‍රස්තාර අංක 04 - ඉඟිනිමිටිය මධ්‍යස්ථානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම



මූලාශ්‍රය- ජලවිද්‍යාත්මක පර්යේෂණ වාර්තාව (දේශගුණ සුහුරු ව්‍යපෘතිය)

වාරිමාර්ග කළමනාකරණය

එල්ලංගා පද්ධතිය තුල පිහිටි මුලු වැව් සංඛ්‍යාව 8කි. වැව් 4 ක පුනරුත්ථපන කටයුතු සඳහා 11 අදියරේ දී පුනරුත්ථාපනය කෙරේ මින් වැව් 02ක් අතීතයේ ඔලගම් වැව් වශයෙන් .පවතින්නට ඇති බවට හඳුනාගත හැකි ය. මෙම වැව් යටතේ ඇති කුඹුරු අක් 07 සිට අක්30 දක්වා පරාසයක් පුරා පවතී යි. අඹගම්මාන වැව යටතේ අක්කර 30ක් කුඹුරු වගා කරයි . ඉහත වගු සටහන අනුව එල්ලංගාවේ ධාරිතාවය දක්වා ඇත.

එල්ලංගාවේ ජළ කළමනාකරණය පිළිබඳව සැලකිල්ලට ගැනීමේ දී මෙම වැව් පිළිබඳව වැදගත් කමක් ඇත.විශේෂයෙන්ම වැව් 04 ක ගොවීන් සංඛ්‍යාව 109 පමණ වේ. එහෙත් මෙම වැව් වල නඩත්තුව ඉතා දුර්වල බව සඳහන් කලයුතුය. ඇලවේලි හාවැව් බැම්මේ නඩත්තුව වසරකට වරක්වත් නිසි පරිදි සිදුනොවේ. මෙයට හේතුව වන්නේ වැව යටතේ වගා කන්නයට පමනක් නඩත්තු කිරීමයි. එක් ගොවි සංවිධානයකට වැව් කිහිපයක් කළමනාකරණය කිරීමට සිදුවී ඇත. මෙම තත්වය නඩත්තුව දුර්වල වීමට හේතුවේ.ගොවි සංවිධානයේ ක්‍රියාකාරී තත්වය හා නීති රීති ද නඩත්තුව දුර්වල වීමට හේතුවේ. මෙම පද්ධතිය තුල පවතින ගොවි සංවිධානයේ තනතරු බෙදීයාමේදී පවතින විශමතාවය මෙයට බලපා ඇත. තවද මෙයට එල්ලංගාවේ පවතින තත්වය සෘජවම බලපාන ලබයි. (රැලි සහිත භූමියක පවතින එල්ලංගාව මුලුමනින්ම ප්‍රජාව පදිංචිව සිටින ගම්මාන වලින් යුක්තය. ගෙවතු ගොඩ ඉඩම් හා විවිධ ස්ථිර බෝග වගාවන්ගෙන් ව්‍යාප්ත වී ඇත බොහොමයක් වැව් වල කුඹුරු සීමාව අවසන් වන්නේ පහලින් පිහිටා ඇති වැවේ තාවුල්ලෙනි. මෙම වැව් තාවුල්ල හා බැදුනු එල්ලංගා පද්ධතියේ ආරක්ෂාවට පැවති අංගෝපංග නැත.) ජල පාලක වරුන් සෑම වසරකම අලුතෙන් පත් කරන්නේ කන්න රැස්වීමේ දීය. ඇතැම් ජලපාලකයන් එක දිගට ම කිහිප වරක් පත්වෙන්නේ ගොවීනන්ගේ කැමැත්තෙනි .ගොවිසංවිදන රැස්වීම් වල සනපුරණය පිලිබඳව ගැටලු ඇත. පද්ධතියේ මෙහෙයුම හා නඩත්තුව ගොවි සංවිධානය මගින් සිදු කරනු ලබන අතර නඩත්තුව ගොවීන් වෙත පංගු ලැස්තුවට අනුව බෙදා ඇත. මෙම මෙහෙයුම් හා නඩත්තු කටයුතු වල නිරතවීම වෙනුවෙන් ජල පාලකක වෙත සලාරිස් හෝ වෙනත් දීමනාවක් ලැබිය යුතු වුවත් එවැන්නක් ක්‍රියාත්මක නොවේ. මෙය අදාල කාර්යය පිලිබඳව වගකීමක් නොගැනීමට හේතුවේ. වර්ෂාව ලැබීම අනුව මහ කන්නයේ වගාව ආරම්බ වන අතර ජලය ඉතිරි වුවහොත් පමණක් යල කන්නයේ බෙත්මට වී වගා කෙරේ . මෙම වගා ක්‍රමය ගොවීන් වගා කටයුතු පිළිබඳව දුර්වල කරන්නාවූ ක්‍රමයකි. වී වගා නොකරන ඉඩම් වල මුං වගාව හෝ වෙනත් ආහාර බෝග වගාවක් සිදු කරනු නොලබයි. මේ හේතුවෙන් මෙහෙයුම් හා නඩත්තුව සම්බන්ධයෙන් ගොවි සහභාගිත්වයේ විශේෂ දුර්වල බවක් පෙන්වයි. තවද මෙහෙයුම් හා නඩත්තුව පිළිබඳව සැලසුමක් හෝ අරමුදලක් පවත්වාගෙන යන බවක් නොපෙනේ. තවද අරමුදල් වර්ධනය වීමක් ද නැත. සංවිධාන වල ඇත්තේ ඉතා සුළු අරමුදලකි. මෙය පද්ධතියේ මෙහෙයුම හා නඩත්තුවට පවතින ප්‍රබල බලපෑමකි. තවද කන්න රැස්වීම හා පංගු ලැයිස්තු අනුව එම තීන්දු තීරණ පැහැර හරින ගොවීන්ට විරුද්දව නීතිමය පියවර නොගැනීමත් මෙහිදී සැලකිල්ලට ගත යුතුය . විශේෂයෙන්ම වගා කරන කන්න වල පමණක් ගොවි සංවිධාන ක්‍රියාත්මක වන අතර බොහෝ ගොවි සංවිධාන නිලධාරීන්ට පමණක් සීමා වී ඇත. විශේෂයෙන්ම සෑම වැවකම පාහේ අඛණ්ඩ නඩත්තුවක් සිදු නොවන අතර වගා කරන කන්න වල පමණක් ඇළවල් සුද්ධ වේ. මේ නිසා බොහෝ වැව් කණ්ඩි වල හා ඇළවල් වල විශාල ගස් වැවී ඇත. එහෙත් කන්න රැස්වීමේ නීතිරීති අනුව නඩත්තු කටයුතු ඉටුවන බව නිලධාරින් පවසති. ඇල පද්ධතිය ඉතා අබලන්ය. මේ නිසා යම් ක්‍රමානුකූල ජල කළමනාකරණයක් සිදු කල නොහැකිය ඇතැම් ඇලමාර්ග කුණු ඇලට ජලය හරවා කුණු ඇල පුරවා කුඹුරු වලට ජලය හරවා ගැනීමට ගොවීන් කටයුතු කරයි. ඒඅනුව ජල කළමනාකරණයක් පිළිබඳව කථා කිරීමට පෙර පද්ධතිය නිසි පරිදි අලුත්වැඩියා කලයුතුය. ගොවි සංවිධාන පොහොර බෙදීම වැනි ඉතා සීමිත කටයුතු වල නිරත වී සිටී. අතීතයේ සිට දේශපාලනය මෙම සංවිධාන වලට දැඩි බලපෑමක් එල්ල කර ඇත.මෙම සංවිධාන වලට වසර 30 කට වැඩි ඉතිහාසයක් පැවතියත් පවතින්නේ ඉතා සුළු අරමුදලකි. සංවිධාන වල පොත් පත් පවත්වාගෙන යාම දුර්වලය. නිසි පුහුණුවක් හෝ උපදෙස් පිළිපදින බවක් නොපෙනේ. මෙම තත්වය සෘජුවම කළමනාකරණයේ දුර්වලතාවයට හේතුවී ඇත.

4.4 පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු

බක්මීවැව එල්ලංගාව අවට පිහිටා ඇති වනාන්තර වර්ග ලෙස වියළි විවෘත වනාන්තර හා කටුපඳුරු සහිත ලඳුකැලෑ බහුලව දැකිය හැකිවේ.මෙම ප්‍රදේශයේ පිහිටි වනාන්තරය බක්මීවැව ප්‍රදේශයේ සිට බොරවැව දක්වා විහිදී ඇත. මෙය නිමලව වනාන්තරය ලෙස හඳුන්වයි. මෙහි විශාල ප්‍රමාණයේ ශාක වර්ග වශයෙන් සියඹලා,මයිල,පලු,වීර,දිවුල්,කරඳහාකුඹුක් වැනි ශාක විශේෂ බහුලව පවතී. පඳුරු වශයෙන් අන්දර හා එරමිණියා විශාල වශයෙන් බහුලව පවතී.

මීට අමතරව මෙම එල්ලංගාවේ ශ්‍රී ලංකානු අලියා,දිවියන්,මුවන්,වල්ඌරන්, වඳුරන්,මොණරුන් වැනි සතුන් ද ඉත්තෑවන්,මීමින්නන් වැනි කුඩා සතුන් ද දැකිය හැක.මීට අමතරව උරගවිශේෂ ලෙස තලගොයා, කබරගොයා, ගැටකිඹුලා, හැල කිඹුලන් හා සර්ප විශේෂ ලෙස නයා, පිඹුරා, පොළඟා, ඇහැටුල්ලා, වල්ගැරඩියා, අහරකුක්කා, මාපිලා, තෙල්කරවලා වැනි සතුන් ද කටුසු වර්ග ලෙස පලාකටුස්සා,ගරාකටුස්සන්,අංකටුස්සන් හා බෝදිලිමා වැනි විශේෂ හූනු විශේෂ ලෙස සුලභ ගේ හූනන්,තිත් හූනන් හා කිඹුල් හූනන් හමුවේ.මෙම ප්‍රදේශයේ දුර්ලභ සනයේ පක්ෂීන් විශේෂ ලෙස අළු කොහා, සිලිබිල්ලා,නිල්කිතලා, ලතුවැකියා,රත්මල් කිරලා දැකියහැක. ආවේණික සතුන් ලෙස තරු ඉබ්බන් සිටියි.තව ද වඳවී යන සත්වයින් ලෙස කැබැල්ලෑවන්,හම්බාවන් එල්ලංගාව තුල ජීවත්වේ.

වනාන්තර වලින් ලබාගන්නා සේවාවන් ලෙස මිනිසුන් දර කඩාගැනීමට වනය නිතර භාවිතා කෙරේ.මීට අමතරව දිවුල්, පලු, වීර වැනි පලතුරු සොයාගැනීමට මිනිසුන් වනාන්තරය භාවිතා කරයි.සත්ව පාලනයේ යෙදෙන ගොවීන් තණකොල හා අනෙකුත් සතුන්ගේ ආහාර සඳහා සතුන් වනාන්තර වලට මුදාහරී.

එල්ලංගාව තුල හේන් වගාව සහ පොල් වගාව බහුලව දක්නට ලැබෙන අතර වනඅලින් සහ මොණරුන්, වල්ඌරන් සහ රිලවුන්ගේ හානිය බහුලව දක්නට ලැබේ. එල්ලංගාව තුල වගාකරනු ලබන සෑම ඉඩමකටම විදුලි වැටවල් යෙදීම නිසා සතුන්ගේ ගමනාගමනයට බාධාවී ඇති අතර මේ නිසා ම අලි මිනිස් ගැටුම උග්‍ර වී ඇත.එසේම සෑම වැව කම වැව් රක්ෂිතය දක්වා වගාකර ඇති අතර මේ නිසා වැව ආරක්ෂාව සඳහා තිබූ ගස් ගොම්මන විනාශ වී ඇත.

එල්ලංගාවේ සිදුවන කෘෂිකාර්මික ක්‍රම බොහෝමයක් දැකගත හැකිය. මෙහි දී හේන් වගාවන් බහුලව සිදුවේ. මෙහිදී සිදුවන වනාන්තර එලිපෙහෙලි කිරීම් එල්ලංගාවේ පැවැත්මට දැඩි තර්ජනයක් වී ඇත.හේන් වගාවන්ට අමතරව පොල් හා අමතර බෝග වගාවන් කිහිපයක් ද නිරීක්ෂණය විය. ඉහල බක්මීවැවට දකුණු දිශාවට ආසන්නයේ අක්කර 5ක පමණ ගල්කොරියක් දක්නට ලැබේ.හේන් සෑදීම සඳහා යොදාගෙන අත්හරින ලද ඉඩම්වල ලඳුකැලෑව බහුලව පවතින නිසා වන සතුන් ද මෙම ප්‍රදේශයේ බහුල වශයෙන් වාසය කරයි. මීට අමතරව ඉහළ හා මැදගනේ ගම වැව් ආශ්‍රිතව තරමක් උස් කළුගල් තලාවක් ගනේගම රජ මහාවිහාරය ඒ ආශ්‍රිතව පිහිටා ඇත. ඉහළ , මැද හා පහළ ගනේගම වැව් වලට අයත් ඉඩම් වලින් බහුතරයක් පන්සල් ඉඩම් වේ.

අඹගම්මන හා පහල වල්පාලුව වැව් වල ජල පෝෂක ප්‍රදේශ ලෙස වනාන්තර දක්නට ලැබේ. අනෙකුත් වැව්වල ජලපෝෂක ප්‍රදේශ වගා කටයුතු සඳහා යොදාගෙන ඇති බව දක්නට ලැබේ. විශේෂයෙන් සාම්ප්‍රදායික වැවක තිබිය යුතු ගස් ගොම්මන, ගොඩවල, පෙරනය,වැව් ඉස්මත්ත වැනි කිසිදු ලක්ෂණයක් දක්නට නොමැත.

